# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,876 - 2014 අගෝස්තු මස 15 වැනි සිකුරාදා - 2014.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 652 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 653 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 655 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 385

MOD/DEF/07/01/AVF/RET/378.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වෙච්ඡා බල සේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් අබේසිංහ මුදියන්සේලාගේ ධර්මකීර්ති ශ්‍රීලපාහ (නි/7346)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

08-512

---

2014 අංක 386

MOD/DEF/07/01/AVF/RET/377.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වෙච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් හේවා ගීගනගේ වීරක්කොඩි ශ්‍රීලංසිරෙ (නි/7465)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

08-511

---

2014 අංක 387

MOD/DEF/10/03/PRO/ST.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට තාවකාලික එයාර් වයිෂ් මාර්ෂල් නිලයට උසස් කෙරේ.

එයාර් කොමදෝරු මාගලගේ ලාල් කිත්සිරි පෙරේරා (01357) පරිපාලන/රෙජි 2013.03.14

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-575

---

2014 අංක 388

MOD/DEF/10/03/PRO/03.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

තාවකාලික ගෲප් කැප්ටන් දොන් කපිල වනිගසූරිය (01503) නි. පො. රා. - 2012.01.01 ;
තාවකාලික ගෲප් කැප්ටන් ප්‍රියන්කර මෙස්ත්‍රීගේ චින්තක ප්‍රියදර්ශන ඩයස් (01578) පරිපාලන/රෙජි - 2012.01.01 ;
තාවකාලික ගෲප් කැප්ටන් රණසිංහ හෙට්ටිආරච්චිලාගේ කමල් ප්‍රියන්ත රණසිංහ (01582) කාර්මික/ඉංජි - 2012.01.01 ;
තාවකාලික ගෲප් කැප්ටන් සමන් චන්ද්‍ර කුමාර පල්ලේවෙල (01628) මෙහෙයුම්/ගුවන් - 2012.01.01 ;
තාවකාලික ගෲප් කැප්ටන් රෝෂාන් සේනක බියන්විල (01644) පරිපාලන - 2012.01.01 ;
තාවකාලික ගෲප් කැප්ටන් රාජ් නිශාන්ත තිලකසිංහ (01687) උපකරණ - 2012.01.01 ;
තාවකාලික ගෲප් කැප්ටන් රත්නායක මුදියන්සේලාගේ මනුජ විශාන්ත බණ්ඩාර වැරැල්ලගම (01550) පරිපාලන - 2012.01.02 ;
තාවකාලික ගෲප් කැප්ටන් මෙතින්ද්‍ර දිල්ශාන් ජයන්ති වාසගේ (01576) පරිපාලන/රෙජි - 2012.01.02 ;
තාවකාලික ගෲප් කැප්ටන් හැඩිගල්ලගේ සම්පත් සුජීව තුහියාකොන්තේ (01642) නි. පො. රා. - 2012.01.02 ;
තාවකාලික ගෲප් කැප්ටන් ප්‍රසන්න රණසිංහ (01646) කාර්මික/ඉංජි - 2012.01.02 ;

තාවකාලික ගෘෘප් කැප්ටන් වර්ණකුලසූරිය විරක්කුට්ටිගේ පීටර්සන් දුමලෝ ප්‍රනාන්දු (01577) පරිපාලන/රෙජි - 2012.01.03 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් ජනක ආදර්ශ් නානායක්කාර (01626) පරිපාලන - 2012.01.03 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් තම්මිට ආරච්චිගේ දොන් රංජිත් සේනානායක (01648) කාර්මික/ඉංජි - 2012.01.03 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් රාජපක්ෂ අප්පුහාමිලාගේ උදේනි ප්‍රියදර්ශන රාජපක්ෂ (01695) නි. පො. රා. - 2012.01.03 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් රවින්ද්‍ර පණ්ඩුකාභය ලියනගමගේ (01641) නි. පො. රා. - 2012.01.04 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් සුජීවන් කීර්ති අබේගුණසේකර සේනාරත්න (01650) කාර්මික/ඉංජි - 2012.01.04 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් ගයිරන ගමගේ වරුණ තිලක් කුමාර ගුණවර්ධන (01655) පරිපාලන/රෙජි - 2012.01.04 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් උපුල සේනක ලියනසූරිය (01705) කාර්මික/ඉංජි. - 2012.01.05 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් කළුආරච්චි කන්කනම්ලාගේ අතුල කුමාර කළුආරච්චි (01659) පරිපාලන/රෙජි - 2012.01.05 ;
තාවකාලික ගෘෘප් කැප්ටන් මුදියන්සේලාගේ පාලිත සෙනෙවිරත්න (01610) පරිපාලන/රෙජි - 2012.01.06 ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී. පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

08-576

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/08/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.08.15 වැනි දින සිට 2014.08.29 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයකුට ඉහත කී තාවකාලික පිටුව අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.09.05 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ මනුප 1/521 දරන පත්ඉරුව | උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, විලච්චිය කෝරළේ, බටහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, විලච්චිය දකුණ ඉවුර පිහිටි "පේමඩුව කැළේ" නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක එෆ්.සී.පී.අ. 02 දරන පිඹුරේ කැබලි අංක 215 දරන ඉඩමට මායිම්,<br>*උතුරට* : කැබලි අංක 213 (අඩිපාර) සහ 216,<br>*නැගෙනහිරට* : කැබලි අංක 216,<br>*දකුණට* : කැබලි අංක 259 සහ 214,<br>*බස්නාහිරට* : කැබලි අංක 214.<br>*ප්‍රමාණය* : අ. 02, රූ. 00, පර්. 25 | 01. ජනාධිපති ලේකම් විසින් 1982.03.10 දින ප්‍රදානය කරන ලද අංක අනු/ප්‍ර/521 දරන දීමනාපත්‍රය<br>02. අංක අනු/ප්‍ර/521 දරන දීමනා පත්‍රයට අදාළව 1994.03.19 දින නිකුත් කළ අනුප්‍රාප්තිකයින් නම් කිරීමේ ලේඛනය |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-564

### වන්දනා ගමන් ආඥාපනත

ගලේවෙල ඓතිහාසික බම්බාව රජමහා විහාරයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඓතිහාසික බම්බාව රජමහා විහාරයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර 2014 අගෝස්තු මස 29, 30 දිනවල පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඒ. එම්. කේ. සී. කේ. අතපත්තු,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

08-538

---

### සබරගමුව මහ සමන් දේවාලයීය ඇසළ උත්සවය - 2014

362 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති අංක 1563 2008.08.15 වැනි දිනැති *ගැසට් පත්‍රය* ප්‍රකාරව හා 1992 අංක 58 දරන බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම් වරුන්) පනත අනුව රත්නපුර ප්‍රාදේශීය ලේකම් චිත්‍රා මානෙල් කෝට්ටවත්ත වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2014 සබරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පවරමි.

01. මෙවර සබරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය 2014 වර්ෂයේ අගෝස්තු මස 24 වැනි දිනෙන් ආරම්භ වී සැප්තැම්බර් 10 වැනි දිනෙන් අවසන් වන බැව් දැනුම් දෙමි.

02. උතුරට වැසියන් පදිංචි පරවේනි නිළකරුවන්නේ ඉඩම් රථගාල් හා සල්පිල් භූමිය පෙන්වන සිමෙන්ති කණුව හා රථ ගාලට ඇතුළු වන පාර ද, දකුණට : තෙන්නගෙවත්ත හා කළුගඟ ද, නැගෙනහිරට : රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට : දේවාලය සතු මහ උයන්වත්ත ද යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ. රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන වාහල් කඩේ සිට කොටාඹේ දක්වා ගමන් කර එතන සිට මාර්ගය ඔස්සේ කළුගඟ දක්වා හා කළුගඟ ඔස්සේ රත්මල් ඇල්ල දක්වා ගමන් කර එම ස්ථානයේදී දිය කපා ආපසු එම මාර්ගය ඔස්සේ නැවත මහ සමන් දේවාලය දක්වා පැමිණ දිය කැපීමේ පෙරහැරේ ගමන් මාර්ගය වේ.

03. දේවාල භූමිය, වැලි මළුව, හුණුවන වීදිය හා කුරුවිට ගම් පහේ වීදියට මැදිව පිහිටි භූමි භාගය හා වීදිය අවට භූමිය තුළ ආහාර පිසීම තහනම් කරමි.

04. පෙරහැර දින 05 සඳහා සල්පිල් භූමිය පිහිටි ස්ථිර මල් කඩ 06 ක්, තාවකාලික වෙළඳසැල් 6 ක් හා සල්පිල් භූමිය තාවකාලික වෙළඳසැල් 200 සඳහා මා විසින් වෙන්දේසි කර අවසරය ලබාදෙන බව දන්වමි. මෙම වෙළඳසැල්හි මල් හඳුන්කූරු, ඉටිපන්දම්, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප, රසකැවිලි, හා විසිතුරු භාණ්ඩ විකිණීම සඳහා අවසරය දෙමි.

05. අංක 04 සඳහන් සල්පිල් භූමියේ හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම තහනම් කරමි.

06. රථගාල පරිශ්‍රය හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිඳු ස්ථානයක පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථවාහන මගින් හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ අවසර පත්‍රයක් නොමැතිව උත්සව භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

07. රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ප්‍රධාන වාහල්කඩ තුලින් දේවාල පූජා භූමියට වාහන ඇතුළත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස්, වෙන්දේසි කරන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

09. වෙන්දේසි කරන ලද වෙළඳ බිම් වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් ලබාගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

10. රත්නපුර ප්‍රාදේශීය ලේකම් මගින් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

#### 15 වැනි ව්‍යවස්ථාව

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම් තැනගේ අවසරය ලබාගෙන මිස විදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන්කර ගන්නා වූ හෝ උත්සව භූමිය තුළ වෙනයම් භූමි කොටසක් හෝ ඇසුරු කරගෙන මඩුවක් හෝ යම් කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතුයි.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ හෝ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

(ඇ) සමන් දේවාල පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාලය සීමාව තුළ දුම් කොළ ආශ්‍රිත නිෂ්පාදන විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2014 ජූලි මස 23 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-484

---

### වන්දනා ගමන් ආඥාපනත

සිත්තාන්ඩි ශ්‍රී චිත්තිරවේලායුද සුවාමි කෝවිල් උත්සවය - 2014

යථෝක්ත උත්සවය 2014 අගෝස්තු මස 25 වැනි දින පටන්ගෙන 2014 සැප්තැම්බර් මස 09 වැනි දින දක්වා පවත්වනු ලබන මෙම උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලුදෙනාගේම දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1984.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ *ගැසට් නිවේදනයේ* සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ හා අනෙකුත් අවධානය මෙයින් යොමු කරමි.

යූ. උදය ශ්‍රීදර්,
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඒරාවූර් පත්තුව,
චෙංකලඩි.

08-574

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජූනි මස 27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රම්පේ විදානලාගේ දිනූෂ සම්පත් චන්ද්‍රසේකර, අංක 338/A, කලාවිටියගොඩ වත්ත, ෆොන්සේකා පාර, හල්තොට. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රෝමනී තලවත්ත විසින් සහතික කරන ලද අංක 352 හා 2013 අගෝස්තු මස 16 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය බන්ධනදායී/උකස්කරු වශයෙන් රම්පේ විදානලාගේ දිනූෂ සම්පත් චන්ද්‍රසේකර යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී රම්පේ විදානලාගේ දිනූෂ සම්පත් චන්ද්‍රසේකර විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත සඳහන් ණය ගැණුම්කරු විසින් එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද, අයිරා පහසුකම් නිසා 2014 මාර්තු 24 වැනි දිනට මුල් හිඟ මුදල වන රුපියල් දසලක්ෂ විසිනවදහස් අටසිය හතළිස් හතරකුත් ශත එකොළහක (රු.1,029,844.11) මුදල සහ එකී මුදල මත 2014 මාර්තු මස 25 වැනි දින සිට එකඟ වූ පරිදි තවදුරටත් පොළිය (මාසික විරාම සහිත වැල් පොළී පදනමින්) ද, සහ වාර ණය නිසා රුපියල් හැත්තෑදෙලක්ෂ අටසිය හැත්තෑදෙකයි ශත හැටහතක (රු.7,200,872.67) මුදල සහ 2014 මාර්තු මස 24 වැනි දිනට හිඟ මුදල වන රුපියල් හැටඅටලක්ෂ පනස්අටකුත් ශත අනූඑකක, (රු.6,800,058.91) මුදල මත 2014 මාර්තු මස 25 වැනි දින සිට එකඟ වූ පරිදි තවදුරටත් පොළිය ද, සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වේතොත්) එම මුදල අඩුකර අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ මූණවත්තේබාගේ පත්තුවේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බලසීමාව තුළ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බටහිර හල්තොට අංක 647 දරන හල්තොට ග්‍රාම නිලධාරි වසමේ ගොනුපාලයාකුරුඳුවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. මල්වැන්න විසින් මැන සාදන ලද අංක 4848 සහ 2011 ඔක්තෝබර් මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක A3 දරන බිම් කොටසට මායිම් උතුරට එම පිඹුරේ කැබලි අංක 1 ද, නැගෙනහිරට : ෆොන්සේකා පාර ද, දකුණට : කැබලි අංක B සහ A2 ද, බස්නාහිරට : කැබලි අංක A2 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 4848 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් එකයි දශම හතරයි අටක් (අ. 0, රූ. 1, පර්. 1.48) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D280/141 දරන වෙළුම යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

08-580

---

## මහජන බැංකුව - සයින්තමරුතු ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඇ) වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

2014.03.28 වැනි දින පැවති තම රැස්වීමේදී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඇ) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමින් කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. එම්. ජමීල් විසින් ලියා සහතික කළ 2012.06.15 දිනැති අංක 5927 දරන උකස් බැඳුම්කරය මත අයවීමට ඇති මුදල් ගෙවීම අබ්දුල් මජීඩ් අන්වර් විසින් පැහැර හැර ඇති හෙයින් අංක 5927 දරන එකී බැඳුම්කරය මත දැනට රුපියල් දොළොස් මිලියන නවසීය දහසය දහස් හයසීය හැට හයයි ශත හැත්තෑවක (12,916,666.70) මුදලක් මහජන බැංකුව වෙත අයවීමට හිඟව සහ ලැබිය යුතුව ඇත. මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ, රුපියල් දෙලොස් මිලියන නවසිය දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක (රු.12,916,666.70) එකී මුදලද 2012.11.15 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වාර්ෂිකව සියයට විසිඑක (21%) බැගින් රුපියල් දොලොස් මිලියන නවසිය දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක (12,916,666.70) මුදල මත වැඩිදුර පොලියද, විකුණුම් පිරිවැය සහ එකී මහජන බැංකු පනතේ "29-L" වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද ඉන්පසු ලැබුණු යම් ගෙවීම් (වෙතොත්) අඩුකර අයකර ගැනීම සඳහා අංක 5927 දරන එකී බැඳුම්කරය මගින් එකී බැංකුව වෙත උකස් කළ දේපල සහ පරිශ්‍රය කොළඹ 12, බෙල්මන් වීදිය, අංක 25 බී දරන ස්ථානයෙහි බලයලත් වෙන්දේසිකරු එරන්දති සමන්මලී රාමනායක මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස්කළ දේපළ විස්තරය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ සෙන්තමරුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්මුණේ නගර සභා සීමා තුළ කරයිවනුපත්තුවේ සෙන්තමරුතු ග්‍රාමයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු

එච්. එල්. ඒ. එම්. හිෂාම් විසින් සකස්කළ 2009.04.22 දිනැති අංක 819 දරන මිනින්දෝරු සැලැස්මේ නිරූපිත "කඩෙයි වලවු" නමැති ඉඩම් කොටසට මායිම් උතුරට : පතුමුත්තු සහ ස්වාමිපුරුෂයා විසින් හිමිකම්පාන වත්තද, නැගෙනහිර සහ දකුණට : එම්. සිත්ති ස්වාහිරා විසින් හිමිකම්පාන වත්තද සහ බටහිරට : කල්මුණේ අක්කරෙයිපත්තු ප්‍රධාන පාරද යන මායම් තුල පිහිටි පර්චස් හතරයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 4.78) විශාලත්වයෙන් යුත් සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියළු දේද සමග වේ. මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව K229/85 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු එස්. නේසරාජ්, විසින් සකස්කළ 2012.01.10 දිනැති අංක SNR/2012/688 දරන වඩාත් මෑතකාලීන මිනින්දෝරු සැලැස්මකට අනුව පහත සඳහන් පරිදි විස්තර කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නැගෙනහිර පළාත් අම්පාර දිස්ත්‍රික්කයේ සෙන්තමරුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙන්තමරුතු - II ප්‍රධාන පාරේ පිහිටි කල්මුණේ නගර සභා සීමා තුළ කඩෙයි වලවු නැමති ඉඩම් කොටස් දෙකට මායිම් උතුරට : පතුම්මා සහ ස්වාමිපුරුෂයා විසින් හිමිකම්පාන ඉඩමද, නැගෙනහිරට : එම්. එම්. සිත්ති සවාහිරා විසින් හිමිකම්පාන ඉඩමද, දකුණට : එම්. එම්. සිත්ති සවාහිරා හිමිකම් පාන ඉඩමද සහ බටහිරට : පාර (මා. සං. අ.) ද යන මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම නවයයි හයක් (අ. 0, රූ. 0, පර්. 3.96) විශාලත්වයෙන් යුත් සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි සහ සියළු දේද සමග,

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
අම්පාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අම්පාර.

08-569

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 මැයි 28 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් ලියා සහතික කරන ලද අංක 244 හා 2010 ඔක්තෝබර් මස 21 හා 25 දින ද, අංක 473 හා 2013 පෙබරවාරි 14 හා 15 දින ද දරන උකස් බැඳුම්කර දෙක මත, අයවිය යුතු මුදල් ගෙවීම්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර තිබෙන හා ලියාපදිංචි අංක පී. වී 12553 දරන සහ ලියාපදිංචි කාර්යාලය නුගේගොඩ පිහිටා තිබෙන, සමාගමක් වන නිල්වලා ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින්ද, 2014 මාර්තු 31 වැනි දිනට ඉහත කී නිල්වලා ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හාරකෝටි පණස් දෙලක්ෂ හැටඅටදහස් තුන්සිය පනහකුත් ශත හතක (රු. 4,52,68,350.07) මුදලක් සහ 2014 අප්‍රේල් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරකෝටි තිස් ලක්ෂ හැට හතර දහස් හයසිය එකක (රු. 4,30,64,601) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ,

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හාරකෝටි පණස් දෙලක්ෂ හැටඅටදහස් තුන්සිය පනහකුත් ශත හතක (රු.4,52,68,350.07) මුදල සහ 2014 අප්‍රියෙල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරකෝටි තිස් ලක්ෂ හැට හතර දහස් හයසිය එකක (රු.4,30,64,601) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම් හා පරිශ්‍ර විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 244 හා 473 දරන උකස් බැඳුම්කර මගින් නිල්වලා ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම සඳහා සහ වෙනුවෙන් එහි අධ්‍යක්ෂවරයකු වන අරුණ උපුල් ජයසිංහ යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම් හා පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන

මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 244 හා 473 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය**

*1 වැනි කොටස*

අංක 473 උකස් බැඳුම්කරයේ "පළමු උපලේඛනයේ" විස්තර කර තිබෙන සහ අංක 244 උකස් බැඳුම්කරයේ උපලේඛනයේ 1, 2, 3, 4, 6 සහ 7 ඡේදවල විස්තර කර තිබෙන දේපල

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව ඇතුළත නැගෙනහිර ගංගොඩවිල ග්‍රාම නිලධාරී වසමේ, උඩහමුල්ල ග්‍රාමයේ පිහිටි, පරණ කොට්ටාව පාර වරිපනම් අංක 390Q දැරූ දැනට කොට්ටාව පාර වරිපනම් අංක 390/4 දරන මිල්ලගහවත්ත නොහොත් කැබෙල්ලගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නැමති ඉඩමේ, බලයලත් මානක කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මැන සකස් කළ අංක 520 හා 1999 දෙසැම්බර් 12 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ ලොට් අංක 21 ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 18 ද නැගෙනහිරට ලොට් අංක 22 ද දකුණට අංක 868A පිඹුරේ ලොට් අංක 2 ද බස්නාහිරට ලොට් අංක 20 ද යන මායිම් ඇතුළත එකී අංක 520 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයක් (අ. 0, රූ. 0, පර්. 9.0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත නැගෙනහිර ගංගොඩවිල ග්‍රාමනිලධාරී වසමේ, උඩහමුල්ල ග්‍රාමයේ පිහිටි, පරණ කොට්ටාව පාර වරිපනම් අංක 390R දැරූ දැනට කොට්ටාව පාර වරිපනම් අංක 390/3 දරන මිල්ලගහවත්ත නොහොත් කැබෙල්ලගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මැන සකස් කළ අංක 520 හා 1999 දෙසැම්බර් 12 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ ලොට් අංක 22 ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 18 ද නැගෙනහිරට ලොට් අංක 23 ද දකුණට අංක 868A පිඹුරේ ලොට් අංක 2 ද බස්නාහිරට ලොට් අංක 21 ද යන මායිම් ඇතුළත එකී අංක 520 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8.0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව ඇතුළත නැගෙනහිර ගංගොඩවිල ග්‍රාමනිලධාරී වසමේ, උඩහමුල්ල ග්‍රාමයේ පිහිටි, පරණ කොට්ටාව පාර වරිපනම් අංක 390S දැරූ දැනට කොට්ටාව පාර වරිපනම් අංක 390/2 දරන මිල්ලගහවත්ත නොහොත් කැබෙල්ලගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මැන සකස් කළ අංක 520 හා 1999 දෙසැම්බර් 12 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ ලොට් අංක 23 ලෙස ලකුණු කල බිම් කට්ටියට මායිම්, උතුරට (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 18 ද නැගෙනහිරට ලොට් අංක 24 ද දකුණට අංක 868A පිඹුරේ ලොට් අංක 2 ද බස්නාහිරට ලොට් අංක 22 ද යන මායිම් ඇතුලත එකී අංක 520 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව ඇතුළත නැගෙනහිර ගංගොඩවිල ග්‍රාම නිලධාරී වසමේ, උඩහමුල්ල ග්‍රාමයේ පිහිටි, පරණ කොට්ටාව පාර වරිපනම් අංක 390T දැරූ දැනට කොට්ටාව පාර වරිපනම් අංක 390/2 දරන මිල්ලගහවත්ත නොහොත් කැබෙල්ලගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මැන සකස් කළ අංක 520 හා 1999 දෙසැම්බර් 12 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ ලොට් අංක 24 ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 18 ද නැගෙනහිරට ලොට් අංක 25 සහ බලයලත් මානක කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මැන සකස් කළ අංක 514 පිඹුරේ ලොට් අංක 2 ද දකුණට අංක 868A පිඹුරේ ලොට් අංක 2 ද බස්නාහිරට ලොට් අංක 23 ද යන මායිම් ඇතුලත එකී අංක 520 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ.0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මෙයට මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම සහ /ඔස්සේ උකස්කරුට ද ඔහුගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට අවසරලාභීන්ට හා ආරාධිතයන්ට මින් ඉදිරියට සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ පාගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයින්, ගවයන් හෝ වෙනත් සතුන් සමඟ හෝ නොමැතිව ද මෝටර් කාර්, මෝටර් ලොරි සහ සෑම ආකාරයකම වෙනත් වාහන මගින් බර පටවා හෝ නොපටවා, මෙහි පහත විශේෂයෙන් විස්තර කරන බිම තුළින් මතින් සහ/හෝ ඔස්සේ සෑම කල්හිම යාම ඊමට හා ප්‍රත්‍යාගමනය කිරීමටද ඇතුළුවීමට හා පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම නිදහස හා අවසරය ද එම බිමෙන්, එය ඔස්සේ සහ ඊට ඉහළින් විදුලි රැහැන්, මුදුන් කම්බි ඇදීමේ සහ ගෑස්, ජලාපවහන හා ජලනල එළීමේ හා වෙනත් කවර වූ හෝ ආකාර උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතිය ද ඇතුළත් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව ඇතුළත නැගෙනහිර ගංගොඩවිල ග්‍රාම නිලධාරී වසමේ, උඩහමුල්ල ග්‍රාමයේ පිහිටි මිල්ලගහවත්ත, නොහොත් කැබෙල්ලගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මැන සකස් කළ අංක 520 හා 1999 දෙසැම්බර් 12 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ ලොට් අංක 18 (පාර සඳහා වෙන් වූ බිම) ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට ලොට් අංක 10, ඇළිය සහ ලොට් අංක 9, 8, 7, 6, 5, 4, 3 සහ 2 ද නැගෙනහිරට පාර (H) ද දකුණට ලොට් අංක 25, 24, 23, 22, 21, 20, 19 ඇළිය සහ ලොට් අංක 17 ද බස්නාහිරට ලොට් අංක 12 සහ ලොට් අංක 13 (අඩි 12ක් පළල පාර සඳහා වෙන් වූ බිම) ද යන මායිම් ඇතුලත එකී අංක 520 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනකුත් දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 23.35) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

*2 වැනි කොටස :*

එකී 473 දරන උකස් බැඳුම්කරයේ "දෙවන උපලේඛනයේ " විස්තර කර තිබෙන සහ අංක 244 දරන උකස් බැඳුම්කරයේ උපලේඛනයේ 5, 6, 8 සහ 9 යන ඡේදවල ද විස්තර කර තිබෙන දේපළ,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මාකුඹුර ග්‍රාම නිලධාරි වසමේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද නොහොත් දෙල්ගහළවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක එස්. ඩී. සරත්චන්ද්‍ර මැන සකස් කළ අංක 273 හා 1982 ඔක්තෝබර් 09 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට ලොට් අංක 3 සහ පාර ද නැගෙනහිරට එකී අංක 273 පිඹුරේ ලොට් අංක 2 ද දකුණට මෙම ඉඩමේම කොටසක් ද බස්නාහිරට මෙම ඉඩමේම කොටසක් ද යන මායිම් ඇතුළත එකී අංක 273 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහඅටකුත් දශම නවයක් (අ. 0. රූ. 0, පර්. 18.9) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

එකී අංක 273 පිඹුරේ ලොට් අංක 1 දරන බිම් කට්ටිය මෑතකදී නැවත මනින ලදුව එකී මැනුම් පිඹුර ප්‍රකාර පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මාකුඹුර ග්‍රාම නිලධාරි වසමේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු මැන සකස් කළ අංක 2300 හා 1994 ජූලි 20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට : පාර ද, නැගෙනහිරට : අංක 273 පිඹුරේ ලොට් 2 ද, දකුණට : එම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : එම ඉඩමේම කොටසක් ද යන මායිම් ඇතුළත එකී අංක 2300 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහඅටකුත් දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 18.9) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙයට මෙහි පහත විස්තර කර තිබෙන බිම් කට්ටි මතින් සහ/ඔස්සේ උකස්කරුටද ඔහුගේ ආගන්තුකයින්ට ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට හා ආරාධිතයන්ට මින් ඉදිරියට සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ පාගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයින්, ගවයන් හෝ වෙනත් සතුන් සමග හෝ නොමැතිව ද මෝටර් කාර්, මෝටර් ලොරි සහ සෑම ආකාරයකම වෙනත් වාහන මගින් බර පටවා හෝ නොපටවා, මෙහි පහත විශේෂයෙන් විස්තර කරන බිම තුළින් මතින් සහ/හෝ ඔස්සේ සෑම කල්හිම යාම ඊමට හා ප්‍රත්‍යාගමනය කිරීමටද ඇතුළුවීමට හා පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම නිදහස හා අවසරය ද එම බිමෙන්, එය ඔස්සේ සහ ඊට ඉහළින් විදුලි රැහැන්, මුදුන් කම්බි ඇදීමේ සහ ගෑස් ජලාපවහන හා ජලනල එලීමේ හා වෙනත් කවර වූ හෝ ආකාර උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතියද ඇතුළත් වේ.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මාකුඹුර ග්‍රාම නිලධාරි වසමේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද නොහොත් දෙල්ගහවත්ත නැමති ඉඩමේ, බලයලත් මානක එස්. ඩී. සරත්චන්ද්‍ර මැන සකස් කළ අංක 273 හා 1982 ඔක්තෝබර් 09 දින දරන පිඹුරේ නිරූපිත (පාර සඳහා වෙන්කළ) ලොට් අංක 2 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට : පාර ද, නැගෙනහිරට : එම්. පී. දයාරත්නට අයිති එම ඉඩමේම කොටසක් ද, දකුණට : මෙම ඉඩමේ කොටසක් ද, බස්නාහිරට: ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත එකී අංක 273 දරන පිඹුර ප්‍රකාර පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 1) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදංචි කර තිබේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු මාකුඹුර ග්‍රාම නිලධාරි වසමේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක එස්. ඩී. සරත්චන්ද්‍ර මැන සකස් කළ අංක 273 හා 1982 ඔක්තෝබර් මස 09 වන දින දරන පිඹුරේ නිරූපිත (පාර සඳහා වෙන්කළ) ලොට් අංක 3 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් අංක 1 ද, බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත එකී අංක 273 දරන පිඹුර ප්‍රකාර පර්චස් දශම එකක් (අ. 0, රූ, 0, පර්. 0.1) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලු පාර,
කොළඹ 03.

08-633

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 මැයි 02 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මනෝරි කේ. ලියනගේ විසින් ලියා සහතික කරන ලද අංක 262 හා 2010 දෙසැම්බර් 07 දින ද අංක 342 හා 2011 සැප්තැම්බර් 13 දින ද දරන උකස් බැඳුම්කර මත, "නිල්වලා වීඩියෝ ටීම්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ නුගේගොඩ, ව්‍යාපාරය කරගෙන යන පන්නිපිටියේ අරුණ උපුල් ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 ජනවාරි 31 වැනි දිනට එකී අරුණ උපුල් ජයසිංහ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දෙකෝටි හැත්තෑහය ලක්ෂ දෙදහස් තුන්සිය පනස් අටකුත් ශත තිස් නවයක (රු.2,76,02,358.39) මුදලක් සහ 2014 පෙබරවාරි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක්කෝටි අසූතුන් ලක්ෂ හැටහය දහස් හයසිය හැටහයක් (රු. 1,83,66,666) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතුරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද රුපියල් හැටහයලක්ෂ හැත්තෑ හතර දහස් අටසිය විසි අටකුත් ශත දහහතක (රු. 66,74,828.17) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්.පී. ආර්) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හයකුත් දශම පහක (6.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් දෙකෝටි හැත්තෑහය ලක්ෂ දෙදහස් තුන්සිය පණස් අටකුත් ශත තිස් නවයක (රු.2,76,02,358.39) මුදලක් සහ 2014 පෙබරවාරි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක්කෝටි අසූතුන්ලක්ෂ හැටහය දහස් හයසිය හැටහයක් (රු.1,83,66,666) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි, සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්.පී. ආර්) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද රුපියල් හැටහයලක්ෂ හැත්තෑ හතර දහස් අටසිය විසි අටකුත් ශත දහහතක (රු. 66,74,828.17) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්.පී. ආර්) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හයකුත් දශම පහක (6.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 262 හා 342 දරන උකස් බැඳුම්කර මගින් එකී අරුණ උපුල් ජයසිංහ යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 292 හා 342 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

***පළමු උපලේඛනය***

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව ඇතුළත අංක 05 කොට්ඨාසයේ පිහිටි කලින් පමුණුව පාර වරිපනම් අංක 81 ක් වූ දැනට වරිපනම් අංක 77/4 දරන, පැලැන්ගහවත්ත නැමති ඉඩමේ බලයලත් මානක, ඩබ්ලිව්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන මැන සකස් කළ අංක 169 හා 1985 මැයි 05 දින දරන පිඹුරේ නිරූපිත ලොට් D01 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට : පී. කන්නන්ගරගේ ඉඩම ද, නැගෙනහිරට : අංක 354 දරන පිඹුරේ ලොට් F ද, දකුණට : අංක 354 පිඹුරේ ලොට් C සහ ලොට් D ද, බස්නාහිරට: චාර්ලිස් අප්පුහාමිගේ ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් විසි අටකුත් දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 28.2) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මෙයට ඉහත කී අංක 354 දරන පිඹුරේ F ලකුණු කර තිබෙන බිම් කට්ටිය මතින් සහ වාහන මගින් ගමනාගමනය කිරීමේ මාර්ග අයිතිය සහ ඉහත කී බිම තුළින්, මතින්, යටින්, ඉහළින් සහ ඔස්සේ විදුලි රැහැන් විදුලි සංදේශ කේබල්, ජලාපවහන නළ, කසළ නළ, ජලනළ, උඩිස් කම්බි සහ වෙනත් උපක්‍රම හා පහසුකම් යෙදීමේ අයිතිවාසිකම ඇතුළත් වේ.

***දෙවන උපලේඛනය***

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක එස්. ඩී. සරත්චන්ද්‍ර මැන සකස් කළ අංක 273 හා 1982 ඔක්තෝබර් 09 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට : ලොට් අංක 3 සහ පාර ද, නැගෙනහිරට : අංක 273 පිඹුරේ ලොට් 2 ද, දකුණට : එම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : එම ඉඩමේම කොටසක් ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 273 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහඅටකුත් දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 18.9) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඉහතින් විස්තර කළ ඉඩම නැවත මනින ලදුව මෑතකදී සකස් කළ පිඹුරක පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු මැන සකස් කළ අංක 2300 හා 1994 ජූලි 20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : පාර ද, නැගෙනහිරට : අංක 273 පිඹුරේ ලොට් 2 ද, දකුණට : එම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : එම ඉඩමේම කොටසක් ද යන මායිම් ඇතුළත එකී අංක 2300 දරන පිඹුරේ ප්‍රකාර පර්චස් දහඅටකුත් දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 18.9) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙයට මෙහි පහත විස්තර කර තිබෙන බිම් කට්ටි මතින් සහ/ඔස්සේ උකස්කරුටද ඔහුගේ ආගන්තුකයින්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට අවසරලාභීන්ට හා ආරාධිතයන්ට මින් ඉදිරියට සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය සහ කැමැත්ත පරිදි කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ පාගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයන්, ගවයින්, හෝ වෙනත් සතුන් සමඟ හෝ නොමැතිව ද මෝටර් කාර්, මෝටර් ලොරි සහ සෑම ආකාරයකම වෙනත් වාහන මගින් බර පටවා හෝ නොපටවා මෙහි පහත විශේෂයෙන් විස්තර කරන බිම තුළින් මතින් සහ/හෝ ඔස්සේ සෑම කල්හිම යාම ඊමට හා ප්‍රත්‍යාගමනය කිරීමටද ඇතුළුවීමට හා පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම නිදහස හා අවසරය ද එම බිමෙන්, එය ඔස්සේ සහ ඊට ඉහළින් විදුලි රැහැන්, මුදුන් කම්බි ඇදීමේ සහ ගෑස්, ජලාපවහන හා ජලනල එලීමේ හා වෙනත් කවර වූ හෝ ආකාර උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතිය ද ඇතුළත් වේ.

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද, නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක එස්. ඩී. සරත්චන්ද්‍ර මැන සකස් කළ අංක 273 හා 1982 ඔක්තෝබර් 09 දින දරන පිඹුරේ නිරූපිත පාර සඳහා වෙන්කළ ලොට් අංක 2 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : පාර ද, නැගෙනහිරට : එම්. දයාරත්නට අයිති එම ඉඩමේම කොටසක් ද, දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත එකී අංක 273 දරන පිඹුරු ප්‍රකාර පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 1) බිම් ප්‍රමාණයේ යුත් බිම් කොටස සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුරේ පිහිටි කොස්ගහලන්ද නොහොත් දෙල්ගහවත්ත නැමති ඉඩමේ, බලයලත් මානක එස්. ඩී. සරත්චන්ද්‍ර මැන සකස් කළ අංක 273 හා 1982 ඔක්තෝබර් 09 දින දරන පිඹුරේ නිරූපිත පාර සඳහා වෙන්කළ ලොට් අංක 3 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් අංක 1 ද, බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත එකී අංක 273 දරන පිඹුර ප්‍රකාර පර්චස් දශම එකක් (අ. 0, රූ. 0, පර්.0.1) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

08-634

**මහජන බැංකුව - පිටකොටුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 දෙසැම්බර් මස 24 වන දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ :

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 2010.11.15 දින අංක 4213 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම හේවා සහබන්දුගේ සුනන්දා කල්‍යානි විසින් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 4213 දරන උකස් බැඳුම්කරය මත දැනට රුපියල් මිලියන තුනයි තුන්ලක්ෂ තිස්හය දහස් නවසිය තිස් හතරයි ශත අනූ දෙකක් (රු. 3,336,934.92) මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, 2013.02.12 දින සිට වෙන්දේසි දිනය දක්වා ඒ මත වර්ෂයකට 16% වූ තවදුරටත් වූ පොලියක් සමග අනතුරුව කිසියම් ගෙවීමක් කර ඇත්නම් එම මුදල අඩු කිරීමෙන් පසුව සහ වෙනත් විකුණුම් පිරිවැය සහ ගාස්තු ද සමග එකී රුපියල් මිලියන තුනයි තුන්ලක්ෂ තිස්හය දහස් නවසිය තිස් හතරයි ශත අනූ දෙකක්වූ (රු.3,336,934.92) මුදල අයකර ගැනීම සඳහා ඉහත කී අංක 4213 දරන උකස් බැඳුම්කරය මගින් ඉහත කී මහජන බැංකුව වෙත උකස්කරන ලද දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පැඟිරිවත්ත පාරේ, ගංගොඩවිල පිහිටා ඇත්තාවූ ද"වැව පල්ලේ ඕවිට" හෙවත් පතිරගේ ඕවිට" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. කන්නන්ගර විසින් සාදන ලද 2007.11.28 දින අංක 2007/57 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස නිරූපනය කර ඇත්තාවූද උතුරට පැඟිරිවත්ත ද නැගෙනහිරට : එම ඉඩමේම අනෙක් කොටස ද, දකුණට : දීපා ඇල ද, බටහිරට : තිස්ස වානගුරු සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩම ද සහ මායිම් තුළ පිහිටියාවූද ප්‍රමාණයෙන් පර්චස් තිස් එකක් (අ. 0, රූ. 0, පර්. 31.0) හෙවත් හෙක්ටයාර් 0.0784 වූ දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ M3164/230 යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 1 දරන දේපළ සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි, ගහකොළ සහ එයට ස්ථිර ලෙස සවිකර ඇති සියලු සවිකිරීම් වේ.

ඇතුලුව ඒ මත වූ වෙනත් සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ උතුර)

මහජන බැංකුව,
කලාප මූලස්ථානය, (බස්නාහිර කලාපය - 01)
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

08-568

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : රෂ්ෆා බදුර්ඩීන් සහ මොහිදීන් රිෆ්කී බදුර්ඩීන්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.07.30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, රෂ්ෆා බදුර්ඩීන් සහ මොහිදීන් රිෆ්කී බදුර්ඩීන් විසින් කලින් පැන් ඒෂිය බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. මධුමාලී අල්විස් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.09.30 දිනැති අංක 209 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, වර්ෂ 2013.09.02 දිනැති අංක 195 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2013.09.30 දිනැති අංක 211 දරන ද්විතීක උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 209, 195 සහ 211 දරන උකස් බැඳුම්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2014.07.06 දින දක්වා මුල් මුදල සහ පොළියද, වශයෙන් රුපියල් පහළොස් මිලියන එකසිය අසූහතර දහස් එකසිය නවයයි ශත පනස් නවය (රු.15,184,109.59) ක මුදල සහ 2014.07.07 වන දින සිට රුපියල් මිලියන පහළව (රු.15,000,000) ක මුදල මත වාර්ෂිකව 16% බැගින් පොළිය ද, සහ 2014.07.06 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දෙසීය විසි හතර මිලියන නවසිය හැට හය දහස් පනස් පහ (රු.224,966,655) ක මුදල සහ 2014.07.07 වන දින සිට රුපියල් දෙසීය පහළොස් මිලියන (රු.215,000,000) ක මුදල මත වර්ෂයකට සියයට දහසය (16%) බැගින් පොලියද පැන් ඒෂිය බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතු තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 209, 195 සහ 211 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් දෙසීය හතලිස් මිලියන එකසිය පනස් දහස් හත්සිය හැට හතරයි ශත පනස් නවය (රු.240,150,764.59) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලියද ගාස්තුද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3(50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**අංක 209 දරන උකස්කරය යටතේ වූ ඉහත සඳහන් උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ (දෙල්කඳ/නුගේගොඩ ලියා පදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 514 හි මැදිවැලිකඩ, කමතවත්ත පාර වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස් ගුණතිලක විසින් සකසන ලද අංක 3222 සහ 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1 හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1 ඒ කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1 ඒ, උතුරට : ලොට් 1 එච් ද, නැගෙනහිරට : ලොට් 1 බී ද, දකුණට : කමතවත්ත පාර සහ බස්නාහිරට : එන්. ඒ. ජී. ඩබ්. පෙරේරාගේ ඉඩම ද මායිම් වූ, එකී පිඹුරු අංක 2230 ට අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) ක් හෝ හෙක්ටෙයාර් 0.0506 ක් වන ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ සහ සියල්ලම ද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ/වෙළුම/පත්ඉරු ඒ 150/96 හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ (දෙල්කඳ/නුගේගොඩ ලියාපදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 514 හි මැදවැලිකඩ, කමතවත්ත පාර වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස්. ගුණතිලක විසින් සකසන ලද අංක 3222 සහ 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1 හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1 බී දරන කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1 බී උතුරට : ලොට් 1 ජී ද, නැගෙනහිරට : ලොට් 1 සී ද, දකුණට : කමතවත්ත පාර සහ බස්නාහිරට : ලොට් අංක 1 ඒ ද මායිම්වූ. එකී පිඹුරු අංක 2230 ට අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් වූ (අ. 0, රූ. 0, පර්. 20) ක් හෝ හෙක්ටයාර් 0.0506 ක් වන ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ සහ සියල්ලම ද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 150/98 හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ (දෙල්කඳ/නුගේගොඩ ලියාපදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 514 හි මැදවැලිකඩ, කමතවත්ත පාර වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස් ගුණතිලක විසින් සකසන ලද අංක 3222 හා 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1 හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1 එච් දරන කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1 එච් උතුරට : දියවන්නා ඔයද, නැගෙනහිරට : ලොට් 1 ජී ද, දකුණට : ලොට් අංක 1ඒ සහ බස්නාහිරට : එන්. ඒ. ජී. ඩබ්. පෙරේරාගේ ඉඩම ද මායිම්වූ, එකී පිඹුරු අංක 2230 ට අනුව ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම නවයක් වූ (අ. 0, රූ. 0, පර්. 3.9) ක් හෝ හෙක්ටයාර් 0.0099 ක් වන ඉඩම සහ ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ සහ සියල්ලම ද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඒ 150/97 හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ/නුගේගොඩ ලියාපදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 514 හි මැදවැලිකඩ, කමතවත්ත පාර වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස් ගුණතිලක විසින් සකසන ලද අංක 3222 සහ 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1 හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින්

සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1 ජී දරන කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1 ජී උතුරට : දියවන්නා ඔය ද, නැගෙනහිරට : ලොට් 1 එෆ් ද, දකුණට : ලොට් අංක 1 බී සහ බස්නාහිරට : ලොට් අංක 1 එච් ද මායිම් වූ එකී පිඹුරු අංක 2230 ට අනුව ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම එක (අ. 0, රූ. 0, පර්. 4.1) ක් වූ හෝ හෙක්ටයාර් 0.0104 ක් වන ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ, සහ සියල්ලමද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඒ 150/99 හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

**උකස්කර අංක 195 සහ 211 යටතේ වූ ඉහත සඳහන් උපලේඛනය**

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කොට්ඨාසය ඇතුළත) අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 83-පල්ලියපිටිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත ඉහළ මඩම්පැල්ල සහ පහළ මඩම්පැල්ල ග්‍රාමයන්හී කෙහෙල්ඇල්ල පල්ලියපිටිය හි පිහිටි (බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් සකසන ලද අංක 2865 සහ 1989 නොවැම්බර් 20 දිනැති පිඹුරෙහි දක්වා ඇති ලොට් අංක 5, 6, 7 සහ 8 සංසර්ජනය කොට අතුරු බෙදීමක් වන) බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සකසන ලද අංක 8537 සහ 2008 සැප්තැම්බර් මස 28 වැනි දිනැති පිඹුරේ ලොට් අංක 1 වශයෙන් දක්වා ඇති දැනට ශාන්ත ජොශෆ්ස් ගෲප් හෙවත් හොරකැලේ එස්ටේට් යනුවෙන් නම්කර හඳුන්වනු ලබන එකම දේපළක් වශයෙන් සැකසී ඇති දන්ගහලන්ද, ඇහැළගහලන්ද, හොරකැලේ, දෙල්ගහවත්ත, දවටගහවත්ත සහ දන්ගොල්ල නමැති ඉඩමේ එකී ලොට් අංක 01ට මායිම්, උතුරට : එම ඉඩමෙහිම ඉතිරි කොටස ද, නැගෙනහිරට : එම ඉඩමෙහිම ඉතිරි කොටස ද, දකුණට : පාර ද (ප්‍රාස) සහ බස්නාහිරට : එම ඉඩමෙහිම ඉතිරි කොටස ද වූ එකී අංක 8537 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර පහ (අ. 5, රූ. 0, පර්. 0) ක් (හෙක්ටයාර් 2.02343)ක් වන ඉඩම එහි පස, ගහකොළ, ගොඩනැගිලි සහ ඒ මතවූ අනෙකුත් සියලුම දේත් සමග වූ මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම ජේ 26/22හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කොට්ඨාසය ඇතුළත), අළුත්කුරු කෝරළේ. දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 83-පල්ලියපිටිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, ඉහළ මඩම්පැල්ල සහ පහළ මඩම්පැල්ල ග්‍රාමයන්හි, කොහෙල්ඇල්ල පල්ලියපිටිය හි පිහිටි (බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් සකසන ලද අංක 2865 සහ 1989 නොවැම්බර් මස 20 දිනැති පිඹුරෙහි දක්වා ඇති ලොට් අංක 5, 6, 7 සහ 8 හි ඉතිරි කොටස සහ බලයලත් මානක ඩබ්. විතාරන විසින් සකසන ලද අංක එන්4684ඒ දරන 2004 මැයි 18 දිනැති පිඹුරේ ලොට් 01 වශයෙන් දක්වා ඇති සම්පූර්ණ ඉඩම වූ) සහ බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සකසන ලද අංක 8557 සහ 2008 ඔක්තෝබර් 09 වැනි දිනැති පිඹුරේ ලොට් අංක 01 වශයෙන් දක්වා ඇති දැනට ශාන්ත ජෝශෆ්ස් ගෲප් හෙවත් හොරකැලේ එස්ටේට් යනුවෙන් නම්කර හඳුන්වනු ලබන එකම දේපළක් වශයෙන් සැකසී ඇති දන්ගහලන්ද, ඇහැළගහලන්ද, හොරකැලේ, දෙල්ගහවත්ත, දවටගහවත්ත සහ දන්ගොල්ල නමැති ඉඩමේ එකී ලොට් අංක 01, උතුරට : චන්ද්‍රපාල ජයසිංහගේ ඉඩම, ඇල සහ ඒ. අප්පුගේ සහ තවත් අයගේ කුඹුර ද, නැගෙනහිරට : බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සකසන ලද එකී අංක 8537 දරන පිඹුරෙහි ලොට් 01, සුමනරත්නගේ කුඹුර, විලියම් අප්පුහාමි සහ අනෙකුත් අයගේ කුඹුර, වේලප්පුගේ උරුමක්කාරයින්ගේ ඉඩම, බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් සකසන ලද අංක 2865 පිඹුරෙහි ලොට් 04, බලයලත් මානක ඩබ්. විතාරන විසින් සකසන ලද අංක 4684 පිඹුරෙහි ලොට් 2-2/2 ද, දකුණට : පාර (ප්‍රාස), බලයලත් මානක ඩබ්. විතාරන විසින් සකසන ලද අංක 4684 පිඹුරෙහි ලොට් 1 සහ පාර (ප්‍රාස) සහ බස්නාහිරට : ගොඩගමුව සිට දූනගහ දක්වා වූ (මාසංඅ) පාර, බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සකසන ලද එකී අංක 8537 දරන පිඹුරේ ලොට් 1 මායිම් වූ එකී අංක 8557 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර පනස් පහයි රූඩ් එකයි පර්චස් දාහතක් (අ. 55, රූ. 1, පර්. 17)ක් හෝ (හෙක්ටයාර් 22.40188) ක් වන ඉඩම එහි පස, ගහකොළ, ගොඩනැගිලි සහ ඒ මත වූ අනෙකුත් සියලුම දේත් සමග වූ මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම ජේ 33/39 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ධර්මරත්නම්,<br>
කළමණාකාර - අය කර ගැනීම්.

08-636

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජුනි මස 27 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන්ත ලලිත් විමලසේකර, අංක 105/2, නැගෙනහිර ඇතුමල්පිටිය, පොළොන්නරුව.

ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් සහතික කරන ලද අංක 2120 සහ 2012 ඔක්තෝබර් මස 16 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය බන්ධනදායී/උකස්කරු වශයෙන් සමන්ත ලලිත් විමලසේකර යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී සමන්ත ලලිත් විමලසේකර විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත සඳහන් ණය ගැණුම්කරු විසින් එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද, අයිරා පහසුකම් නිසා 2014 ජනවාරි 08 වන දිනට මුල් හිඟ මුදල වන රුපියල් තිස්එක්ලක්ෂ හතලිස් එක්දහස් හතලිස් එකකුත් ශත තිස්අටක (රු. 31,41,041.38) ) මුදල සහ එකී මුදල මත 2014 ජනවාරි මස 09 වන දින සිට එකඟ වූ පරිදි තවදුරටත් පොළිය (මාසික විරාම සහිත වැල් පොළී පදනමින්) ද, සහ වාර ණය නිසා රුපියල් තිස්පන්ලක්ෂ හැටදෙදහස් හාරසිය අනූහතකුත් ශත අසූතුනක (රු. 35,62,487.83) මුදල සහ 2014 ජනවාරි මස 08 වන දිනට හිඟ මුදල වන රුපියල් තිස්එක්ලක්ෂ හැත්තෑපන්දහස් හැත්තෑතුනකුත් ශත එකක (රු. 31,75,073.01) මුදල මත 2014 ජනවාරි මස 09 වන දින සිට එකඟ වූ පරිදි තවදුරටත් පොළිය ද, සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකර අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පොළොන්නරුවේ නව නගරයේ පිහිටි පට්ටිය දමන මූකලාන නමැති ඉඩමට මිනුම්පති විසින් සහතික කොට භාරයේ තබාගෙන ඇති අංක F.C 160 P.Po. 160 (11 අන්තර් සිතියම) දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1023 දරන බෙදාවෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 1022 ද, නැගෙනහිරට : කැබලි අංක 1025 ද, දකුණට : කැබලි අංක 1024 ද, බස්නාහිරට : කැබලි අංක 535 ද යන මෙකී මායිම් තුළ පිහිටි හෙක්ටයර බිංදුවයි දශම බිංදුවයි නවයයි අටයි බිංදුවක් (හෙක්ටයාර් 0.0980) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 11/164 දරන මෑත කාලීන පිඹුර ප්‍රකාරව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ මැද පත්තුවේ, පොළොන්නරුව නව නගරයේ පිහිටි පට්ටිය දමන නමැති ඉඩමට (මිනුම්පති විසින් මැන සාදන ලද අංක F.C. P. Po. 160 දරන පිඹුරේ කැබලි අංක 1023හි නැවත මැන බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 11/164 සහ 2011 දෙසැම්බර් මස 22 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම්, උතුරට : අංක F.C. P. Po. 160 දරන පිඹුරේ කැබලි අංක 1022 ද, නැගෙනහිරට : අංක F.C. P. Po. 160 දරන පිඹුරේ කැබලි අංක 1025 ද, දකුණට : අංක F.C. P. Po. 160 දරන පිඹුරේ කැබලි අංක 1024 ද, බස්නාහිරට : අංක F.C. P. Po. 160 දරන පිඹුරේ කැබලි අංක 535 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්නවයයි දශම පහයි හතරක් විශාල (අ. 0, රූ. 0, පර්. 39.54) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි බිංදුවයි බිංදුවක් (හෙක්ටයාර් 0.100) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

08-581

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.